*කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 (1)*

මගේ අංකය : ඩීඑම්එස්/දීමනා/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2007.01. 25

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු**
**සමාගම්වල සේවකයන්ට ජීවන වියදම් දීමනාව ගෙවීම**

2006.01.17 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 27 හි 04 වැනි ඡේදය හා 2006.08.31 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ජීවන වියදම් දර්ශකයට අනුව ජීවන වියදම් දීමනාවක් හෝ ඊ හා සමාන දීමනාවක් නොගෙවන්නා වූ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයන් සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 යටතේ දැනට ගෙවනු ලබන රු:1375/- ක (එක්දහස් තුන්සිය හැත්තෑපහ) මාසික ජීවන වියදම් දීමනාව, 2007.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු:1750/- ක (එක්දහස් හත්සිය පනහක) මාසික ජීවන වියදම් දීමනාවක් ලෙස සංශෝධනය කෙරේ.

03. දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා 2007.01.01 දින සිට සේවය කරන දිනකට රු:58.34 බැගින් මසකට රු:1750/- ක උපරිමයකට යටත්ව මෙම දීමනාව ගෙවිය හැකිය.

පී බී ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති

} දැනගැනීම සඳහා